ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

වාර්ෂික වාර්තාව

2018

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
නො. 46-48, කොටා පාර
කොළඹ 08

පටුන

පිටුව

කොමිසමෙහි සාමාජිකයින්		3
විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්		4
කොමසාරිස්තුමාගේ පණිවිඩය		5,6
1.	**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**	
1.1	හැඳින්වීම	7
1.2	දැක්ම	7
1.3	මෙහෙවර	7
1.4	පරමාර්ථ	7
1.5	කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්	7,8
1.6	ආයතනික සැලැස්ම	9
1.7	මානව සම්පත	10
2.	**2018 වර්ෂයේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්**	
2.1	“සහසක් නිමැවුම් 2018” ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය	10,14
2.2	ජනාධිපති සම්මාන ප්‍රදානය	15
2.3	ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය	15,17
2.4	නවෝත්පාදන ඇගයුම් විශේෂඥ මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	17
2.5	පාසල් නව නිපැයුම්කරුවන් සඳහා කුසලතා සංවර්ධන වැඩමුළුව	17
2.6	නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL ව්‍යාපෘතිය	18
2.7	නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන “නව නිපැයුම් දිරිය”	18
2.8	තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres)	18
2.9	“Innova Minds 2018” යොවුන් නව නිපැයුම්කරුවන් සඳහා වන රූපවාහිනී වැඩසටහන	19
2.10	ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ ප්‍රවේශය	19,21
2.11	ජාත්‍යන්තර සබඳතා	22
2.12	නව නිපැයුම්කරුවන්ගේ හමුව	22
2.13	නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සේවා සැපයීම	22,25
2.14	නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන් ලබාදීම	26
2.15	මානව සම්පත් සංවර්ධනය	26
2.16	මූල්‍ය ප්‍රාග්ධන ප්‍රගතිය	27
2.17	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සතු සුවිශේෂී බුද්ධිමය වත්කම්	28
3.	**මූල්‍ය ප්‍රකාශනය**	29,45

කොමිසමෙහි සාමාජිකයින්

2018.01.01 සිට 2018.11.30 දක්වා

ආචාර්ය සී. මහේෂ් එදිරිසිංහ මහතා
කොමසාරිස්

එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා
සහකාර කොමසාරිස්

කල්පනී රාජපක්ෂ මහත්මිය
සහකාර කොමසාරිස්

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

2018.12.01 සිට 2018.12.31 දක්වා

ඩී. නන්දනී සමරවික්‍රම මහත්මිය
[අතිරේක ලේකම් (පරිපාලන) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
කොමසාරිස් (වැ.බ.)

එල්. සුරේකා එච්. හේවගේ මහත්මිය
[ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. එල්. එස්. නසීමා මහත්මිය
[අධ්‍යක්ෂ (සැලසුම්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

2018.01.01 සිට 2018.11.30 දක්වා

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා
සහකාර කොමසාරිස්

කල්පනී රාජපක්ෂ මහත්මිය
සහකාර කොමසාරිස්

එම්. සී. ගමගේ මහතා
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

සී. පී. ආර්. බණ්ඩාර මහත්මිය
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

සුජීවා ද සිල්වා මහත්මිය
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

2018.12.01 සිට 2018.12.31 දක්වා

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

එල්. සුරේකා එච්. හේවගේ මහත්මිය
[ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස්

ඒ. එල්. එස්. නසීමා මහත්මිය
[අධ්‍යක්ෂ (සැලසුම්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස්

සී. පී. ආර්. බණ්ඩාර මහත්මිය
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

කොමසාරිස්තුමාගේ පණිවිඩය



මහාචාර්ය ආර්. යූ. හල්වතුර
කොමසාරිස්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ බලාත්මක කරන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ දේශීය නවෝත්පාදනය දිරිගන්වමින්, නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීතිමය සහයෝගය ලබාදීමයි.

මෙම පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සෑම විටම විවිධත්වයකින් යුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර, එමගින් දේශීය නව නිපැයුම්කරුවා දිරිගැන්වීමටත්, ඔහුට අවශ්‍ය සහයෝගය ලබාදීමටත් හැකියාව ලැබී තිබේ. ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීම තුලින් ජනතාව නිර්මාණශීලී පුරවැසියන් බවට පත් කිරීමත්, ඒ ඔස්සේ දේශීය ආර්ථිකය සවිමත් කිරීමත් අපේක්ෂා කෙරේ. සරලව ගත් කල නව නිපැයුම් මවන දැයක් තුලින් ප්‍රතිලාභ ලබනුයේ නව නිපැයුම්කරුවා පමණක් නොව, සමස්ථ සමාජයටම එය හිතකර ලෙස බලපාන සත්‍යයක් බවට පත් වේ.

මේ සෑම අපේක්ෂාවක්ම මුදුන්පමුණුවා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම නිරන්තරයෙන් සැදී පැහැදී සිටින අතර, එය ඉලක්ක කරගත් විශේෂිත වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලබයි. “සහසක් නිමැවුම්” ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයට ඒ අතරින් හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. 2012 වර්ෂයේ දී පළමු වරට ක්‍රියාවට නැංවුණු මෙම වැඩසටහන 2018 වසරේදී හත් වන වරටත් සාර්ථකව සංවිධානය කෙරුණි. දිවයින පුරා විසිරී සිටින දක්ෂතා පරිපූර්ණ නව නිපැයුම්කරුවන් හඳුනාගනිමින් ඔවුන් ජාතික තලයට රැගෙන ඒමටත්, ඒ ඔස්සේ නව නිපැයුම්කරුවනට සුවිශේෂී ප්‍රතිලාභ හා අත්දැකීම් ලබාදීමටත් මෙමගින් හැකියාව ලැබී තිබේ.

නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත ප්‍රකාරව නවෝත්පාදනය වෙනුවෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම පාදක කර ගනිමින්, වාණිජකරණ විභවයක් සහිත නව නිපැයුම් වෙළෙඳ පොළ වෙත ගෙන යෑම සඳහා “IAFM-SL” (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) හා “නව නිපැයුම් දිරිය” නමින් ව්‍යාපෘති ද්විත්වයක් හඳුන්වා දී ඇත. මෙහිදී විශේෂඥ විනිසුරුවන් ගේ ඇගයීම් අනුව හඳුනාගත් යෝග්‍ය වූ නිපැයුම් වෙනුවෙන් මූල්‍යමය හා තාක්ෂණික සහයෝගය ලබාදීම සිදුකරනු ලබයි. එමෙන්ම ජාතික නවෝත්පාදන බීජෞෂණ මධ්‍යස්ථාන පිහිටුවීම මගින් දේශීය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පියවර ගෙන තිබේ. මෙයට අමතරව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ අවශ්‍යතා වෙනුවෙන් සෙසු ආයතන වෙත යොමු කිරීමට ද කටයුතු යොදා තිබේ.

තව ද නව නිපැයුම් වල සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම සඳහා බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ලබාගැනීම වෙනුවෙන් නව නිපැයුම්කරුවන්ට මාර්ගෝපදේශකත්වය ලබාදීමේ විශේෂිත වැඩපිළිවෙලක් ද කොමිසම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. දේශීය මෙන්ම විදේශීය පේටන්ට් අයදුම් කිරීම සඳහා ද දායකත්වය ලබාදීම විශේෂත්වයකි.

ශ්‍රී ලාංකේය පාසල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සංවිධානය කරනු ලබන “Innova Minds” වැඩසටහනට හිමි වනුයේ ද ආකර්ශනීය ස්ථානයකි. යොවුන් නව නිපැයුම්කරුවන් දිරි ගන්වමින් ඔවුන්ගේ නිර්මාණශීලීත්වය ජනතාව අතරට ගෙන යෑමටත්, එමගින් නවෝත්පාදන කෙරෙහි පාසල් ප්‍රජාව නැඹුරු කරවමින් රටට ප්‍රයෝජනවත් නිපැයුම් බිහි කිරීමට දිරි දීම අරමුණු කරගත් දෘශ්‍ය මාධ්‍යමාධ්‍ය වැඩසටහනක් ලෙස මෙය හඳුන්වා දිය හැකි ය.

දේශීය නව නිපැයුම්කරුවන් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීම වෙනුවෙන් පනත මගින් පවරා ඇති බලතල අනුව, ඒ ඒ වර්ෂයන් හි බුද්ධිමය දේපළ හිමිකම ලබාගත් නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම සිදු කරනු ලබයි. එය නිපැයුම් ඇගයීම සිදුකෙරෙනුයේ ද අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මගිනි.

මෙයට අමතරව නව නිපැයුම්කරුවන් හමුවේ ඇති ගැටළු සාකච්ඡා කිරීම සඳහා විශේෂිත සාකච්ඡා පවත්වනු ලබන අතර, නව නිපැයුම්කරුවන්ගේ ශක්‍යතා වර්ධනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර තරඟ සඳහා යොමු කරවීම, සෑම වසරකම ඔක්තෝබර් මස 26 දිනට යෙදෙන ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීම, නව නිපැයුම්කරුවන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම, නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදී වූ එකිනෙකට වෙනස් කාර්යභාරයන් රැසක් ඉටු කිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබී තිබේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මේ දක්වා තබා ඇති සෑම සාර්ථක පියවරකදීම සිය උපරිම දායකත්වය ලබාදුන් කොමිසම සතු සීමිත වූ කාර්යමණ්ඩලය හා ඒ සඳහා මහ පෙන්වමින් ධෛර්යයක් වූ පාලක මණ්ඩල සාමාජිකයින් ප්‍රශංසනාත්මකව අගය කළ යුතු ය.

නවෝත්පාදන සංස්කෘතියක් තුලින් යහපත් වූ හෙට දවසක් ශ්‍රී ලංකාව තුල නිර්මාණය කිරීම උදෙසා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දරන්නා වූ අපිරිමිත උත්සාහය හමුවේ සහයෝගයෙන් කටයුතු කළ සියළු දෙනා වෙත ස්තුතිය පිරිනමන අතර, නවෝත්පාදනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාවට නැංවෙන සුවිශේෂී වැඩකටයුතු වෙනුවෙන් සෑම දෙනාගේ සහයෝගය හිමි වනු ඇති බවට තරයේ විශ්වාස කරමි.

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික නිපැයුම් වලට හා ඒවා නිෂ්පාදනය කිරීමට අනුග්‍රහ දැක්වීම හා ධෛර්ය දීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා විධි විධාන සලස්වමින් 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කොමිසම වර්තමානයේ උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 දැක්ම

“නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්”
(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදා කිරීම)

1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයින්ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීමේ ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

1.4 පරමාර්ථ

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම වෙනුවෙන් ඔවුනට ධෛර්යය දීම.

1.4.2 නව නිපැයුම්කරුවනට තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබා දීම.

1.4.3 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්රුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලු බලතල, කර්තව්‍යය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු කටයුතු කිරීම.

1.5 කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ) පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඇ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවනට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම. නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවනට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජාතික ආරක්ෂාව, ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂාව හා සුභ සාධනය, පොදු කර්මාන්ත, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන් හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(ඌ) "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" තරගවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන "නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.

(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළකිරීම සහ පතළ කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගීවීමට ශ්‍රී ලාංකීක නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

1.6 ආයතනික සැලැස්ම



1.7 මානව සම්පත

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2018 වර්ෂයේ කාර්ය මණ්ඩලය	2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	02	02	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මුදල්)	01	01	-
වැඩසටහන් නිලධාරී	03	01	02
පරිපාලන නිලධාරී	01	01	-
මූල්‍ය නිලධාරී	01	01	-
පර්යේෂණ සහකාර	05	04	01
කළමනාකරණ සහකාර	07	06	01
රියදුරු	04	04	-
කාර්යාල සහායක	02	02	-



2. 2018 වර්ෂයේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

2.1 "සහසක් නිමැවුම් 2018" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය

"සහසක් නිමැවුම්" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සංවිධානය කරනුයේ ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් සතු නවොත්පාදන කුසලතාවයන් දිරිගන්වමින් එම නිපැයුම් එළිදැක්වීම තුලින් වාණිජකරණය දක්වා වූ මාර්ගය විවර කරදීම වෙනුවෙනි. මෙය අදියර කිහිපයක් ඔස්සේ ක්‍රියාවට නැංවෙන සුවිශේෂී වැඩසටහනකි.

ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක දායකත්වය ඇතිව දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි පවත්වනු ලබන මූලික ඇගයීම් වලින් අනතුරුව "සහසක් නිමැවුම්" නිර්ණායකයන්ට අනුකූල වූ නව නිපැයුම් සඳහා ජාතික ප්‍රදර්ශනය වෙත ඉදිරිපත් වීමේ අවස්ථාව හිමි වේ.

පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් හා විවෘත යන ප්‍රධාන අංශ හතරක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) නියෝජනය වන පරිදි තරඟය සඳහා ඉදිරිපත් වීමට නව නිපැයුම්කරුවනට අවස්ථාව හිමි වේ.

- මහජන අරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහනය
- ඉංජිනේරු

"සහසක් නිමැවුම්" ජාතික නව නිපැයුම් තරඟයට ඉදිරිපත් වන නව නිපැයුම්කරුවන් හට හිමි වන වරප්‍රසාද බොහෝ ය. ජාතික ප්‍රදර්ශනයකදී සිය නිර්මාණාත්මක හැකියාවන් හා දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීමට අමතරව විවිධ වූ ජයග්‍රහණ රාශියක් වෙනුවෙන් තරඟ කරන අතරතුර, සිය නිපැයුම් වාණිජකරණය සඳහා පසුබිම සකස් වීම මෙන්ම ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමට අවස්ථාව සැලසීම ද ඒ අතරින් ප්‍රධාන වේ.

"සහසක් නිමැවුම්" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය 2018 වසරේ සැප්තැම්බර් මස 14 සිට 16 දින දක්වා කොළඹ 10, ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේදී හත් වන වරට සාර්ථක අයුරින් පවත්වන්නට යෙදුණි. මෙම ජාතික ප්‍රදර්ශනය සඳහා ඉලක්කගත නව නිපැයුම් හඳුනාගැනීම වෙනුවෙන් පළාත් මට්ටමේ ඇගයීම් කටයුතු පහත පරිදි පවත්වන ලදී.

පළාත	දිනය	ස්ථානය
සබරගමුව	2018 මැයි 03	තාක්ෂණ විද්‍යාලය, රත්නපුර
දකුණ	2018 මැයි 08 2018 මැයි 09 2018 මැයි 10	ඉංජිනේරු පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, ගාල්ල භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර තාක්ෂණ විද්‍යාලය, බෙලිඅත්ත
නැගෙනහිර	2018 මැයි 19	මහජන විද්‍යාලය, මඩකලපුව
උතුර	2018 මැයි 21	පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, යාපනය විශ්වවිද්‍යාලය
උතුරැ මැද	2018 මැයි 25	තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර
ඌව	2018 ජූනි 02	සත්ත්ව විද්‍යා පීඨය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
වයඹ	2018 ජූනි 06	තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල
මධ්‍යම	2018 ජූනි 09	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
බස්නාහිර	2018 ජූනි 21 2018 ජූනි 22 2018 ජූනි 23 2018 ජූනි 24	ඥානෝදය විද්‍යාලය, කළුතර ගුරුකුල විද්‍යාලය, කැලණිය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08






පළාත් මට්ටමේ නව නිපැයුම් ඇගයීමේ අවස්ථාවන්

පළාත් මට්ටමේ ඇගයීම් කටයුතු සඳහා පළාත් වශයෙන් ඉදිරිපත් කෙරුණු නව නිපැයුම් සහ ඒ අතරින් ජාතික තලයට සුදුසුකම් ලත් නව නිපැයුම් පිළිබඳ දත්ත පහත පරිදි වේ.

පළාත	පාසල්		විවෘත		විශ්වවිද්‍යාල		වාණිජකරණ		එකතුව	
	ඉදිරිපත් වූ සංඛ්‍යාව	සුදුසුකම් ලද සංඛ්‍යාව	ඉදිරිපත් වූ සංඛ්‍යාව	සුදුසුකම් ලද සංඛ්‍යාව	ඉදිරිපත් වූ සංඛ්‍යාව	සුදුසුකම් ලද සංඛ්‍යාව	ඉදිරිපත් වූ සංඛ්‍යාව	සුදුසුකම් ලද සංඛ්‍යාව	ඉදිරිපත් වූ සංඛ්‍යාව	සුදුසුකම් ලද සංඛ්‍යාව
සබරගමුව	129	22	11	5	1	0	0	0	**141**	**27**
උතුරු මැද	25	4	9	4	3	2	0	0	**37**	**10**
දකුණ	252	36	58	16	41	4	2	2	**353**	**58**
වයඹ	52	7	15	5	9	2	0	0	**76**	**14**
නැගෙනහිර	115	19	46	8	16	11	0	0	**177**	**38**
උතුර	163	12	15	5	3	2	0	0	**181**	**19**
මධ්‍යම	198	15	34	10	6	3	0	0	**238**	**28**
ඌව	202	19	0	0	7	4	0	0	**209**	**23**
බස්නාහිර	262	31	102	27	19	4	4	2	**387**	**64**
යුධහමුදා මූලස්ථානය	-	-	198	30	-	-	-	-	**198**	**30**
එකතුව	**1398**	**165**	**488**	**110**	**105**	**32**	**6**	**4**	**1997**	**311**

මෙවර ‘‘සහසක් නිමැවුම්’’ ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සඳහා පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් හා විවෘත යන ප්‍රධාන අංශ හතර නියෝජනය වන පරිදි උක්ත සඳහන් තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) ඔස්සේ නව නිපැයුම් තුන්සිය එකොළහ (311) ක සංඛ්‍යාවක් සුදුසුකම් ලබා තිබුණි.

සහසක් නිමැවුම් 2018 ජාතික ප්‍රදර්ශනයේ විශේෂ අවස්ථාවන්





















"සහසක් නිමැවුම් 2018" සඳහා පළාත් අනුව සහභාගීත්වය



ප්‍රධාන අංශ අනුව සහභාගීත්වය



2.2 ජනාධිපති සම්මාන ප්‍රදානය

ජනාධිපති සම්මාන ප්‍රදානය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පනත මගින් පවරා දෙනු ලැබූ සුවිශේෂී ක්‍රියාකාරකමකි. වාර්ෂිකව බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ලබාගන්නා නව නිපැයුම්කරුවන්ගේ කුසලතා ඇගයීම වෙනුවෙන් මෙම සම්මාන පිරිනමනු ලබයි. අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන විනිශ්චයමණ්ඩලයක් විසින් තාක්ෂණික ක්ෂේත්‍ර 14 ක් ඔස්සේ නව නිපැයුම් ඇගයීමට ලක් කරන අතර, හඳුනාගනු ලබන විශිෂ්ට නව නිපැයුම් සඳහා කුසලතා සම්මාන සහ වසරේ විශිෂ්ටතම නව නිපැයුමට හිමි ජනාධිපති සම්මානය ද පිරිනමනු ලබයි. 2015 හා 2016 වර්ෂයන් හි පේටන්ට් බලපත්‍රලාභී නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය 2018 ඔක්තෝබර් මස 26 වන දින පැවැති ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීමේ උත්සවයේ දී සිදුකෙරුණි. මෙහිදී 2015 වසරේ විශිෂ්ටතම නව නිපැයුම වශයෙන් කෝට්ටගොඩගේ ලක්ෂ්මන් මහතා විසින් නිපදවන ලද "කොලපු පෝරුව" සම්මානයට පාත්‍ර වූ අතර, සමස්ථයක් ලෙස නව නිපැයුම් 38 ක් සඳහා සම්මාන පිරිනමන ලදී.



2015 විශිෂ්ටතම නව නිපැයුමට හිමි සම්මානය කෝට්ටගොඩගේ ලක්ෂ්මන් මහතා විසින් අතිගරු ජනාධිපතිතුමන් වෙතින් ලබාගත් අවස්ථාව

2.3 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීම

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් විසින් ඉටු කරන්නා වූ මෙහෙවර හා දේශීය ආර්ථිකය වෙනුවෙන් ලබාදෙන්නා වූ දායකත්වය ඇගයීම සඳහා සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දින ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධුරය හෙබවූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමන් විසින් ඉටු කළ අපරිමිත සේවාව ඇගයීම උදෙසා එතුමන් ගේ ජන්ම දිනය පාදක කර ගනිමින් මෙම දිනය නම් කර තිබේ. ඒ අනුව ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනයෙහි තෙවන සැමරුම් උත්සවය 2018 ඔක්තෝබර් මස 26 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී උත්කර්ශවත් අයුරින් පැවැත්විණි.

ජාතික නිපැයුම්කරුවන් ගේ දිනය ස්ථාපිත කිරීමේ අරමුණු

- නව නිපැයුම්කරුවන් ඇගයීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කිරීම හා නව නිපැයුම්කරණය කෙරෙහි ඔවුන් දිරි ගන්වමින් නවෝත්පාදන ආර්ථිකයක් කරා රට මෙහෙයවීම.

- නව නිපැයුම්කරුවන් හා සමීප වීම සඳහා කොමිසමට අවස්ථාවක් ලබා ගැනීම.

- නව නිපැයුම්කරුවන් ගේ දිනය ප්‍රකාශයට පත්කිරීම මඟින් නව අයෝජන අවස්ථා ලබාදීම කෙරෙහි නව නිපැයුම්කරුවන් ගේ අවධානය ලබාගැනීම.

- ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනයට සමගාමීව වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයන් සංවිධානය කිරීම මගින් වඩාත් කාර්යක්ෂමව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලබා දීම.

- නව සොයාගැනීම් තුළින් සංවර්ධිත අර්ථිකයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකීය නිපැයුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීම.

- සම්මානනීය නව නිපැයුම්කරුවන් හඳුනා ගැනීම.

ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනයේ දී ඇගැයීමට ලක් වූ "සහසක් නිමැවුම්" ජයග්‍රාහකයෝ

ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේදී 2018 සැප්තැම්බර් මස 14, 15 හා 16 යන තෙදින පුරා හත් වන වරට පවත්වන ලද "සහසක් නිමැවුම්" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේ ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් හට සම්මාන පිරිනැමීමේ අභිමානවත් අවස්ථාව ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීමේ උත්සව දිනයේ දී පැවැත්වුණි.

සෑම අංශයකම ඒ ඒ තාක්ෂණික ක්ෂේත්‍රය ආවරණය වන පරිදි ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා ජයග්‍රාහකයින්ට පදක්කම්, සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනැමුණු අතර විශිෂ්ටතම නව නිපැයුම සඳහා "දසිස්" කුසලානය ඇතුළුව සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනමන ලදී. "දසිස්" යනු නව නිපැයුම් පරපුරේ පෙරළියක් වූ දඬුමොනරය නිර්මාණය කළ රාවණා රජුට අන්වර්ථ නාමයක් වන අතර, එය නූතන නව නිපැයුම් සමඟ ඉතිහාසය යා කරන්නා වූ පෞරාණික වටිනාකමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

එමෙන්ම මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ දී පාසල් අංශයේ නව නිපැයුම්කරුවන් ගේ ජයග්‍රහණ වෙනුවෙන් දායකත්වය ලබාදුන් ගුරුභවතුන් ඇගයීම ද සිදු කෙරුණි.

ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් හට ඉදිරියේ පැවැත්වෙන විදෙස් නව නිපැයුම් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමේ අවස්ථාව ද හිමි වේ.

2018 වසරේ "දසිස්" කුසලාන ජයග්‍රාහකයන්



වාණිජකරණ අංශය

ඩබ්. එම්. ජයවර්ධන මහතා

(නව නිපැයුම - බීජ සිටුවීමේ හා පොහොර යෙදීමේ යන්ත්‍රය)



පාසල් අංශය

මාතර අකුරුගොඩ කනිෂ්ඨ විද්‍යාලයේ

උදාර දෙවිමික ශිෂ්‍යයා

නව නිපැයුම - එළවළු හා පළතුරු ප්‍රවාහන බහාලුම





විවෘත අංශය

සී. එච්. මනෝරත්න මහතා හා ආචාර්ය ආර්. එම්. ධර්මදාස
නව නිපැයුම - පළතුරු මැස්සන් පළවාහරින පරිසර හිතකාමී නිෂ්පාදනය

ජයග්‍රාහකයින් අතිගරු ජනාධිපතිතුමන් සමඟ

2.4 නවෝත්පාදන ඇගයුම් විශේෂඥ මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වසර මුළුල්ලෙහි විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන අතර, ගුණාත්මක භාවයකින් යුතු ප්‍රමිතිගත නව නිපැයුම් හඳුනාගැනීම සඳහා විවිධ තරඟ ද පවත්වනු ලබයි. මෙම භාරදූර කර්තව්‍ය ඉටු කරවා ගැනෙනුයේ විවිධ ක්ෂේත්‍රයන් හි නිපුණතාවයන් ඇති ප්‍රවීණ විනිසුරුවන් වෙතිනි. එම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වර්ෂයක් පාසා විනිශ්චයමණ්ඩලය යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති අතර, 2018 වසරේ දී ද එම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. එලෙස හඳුනා ගත් විශේෂඥයන් හතළිස් පස් දෙනෙකු ගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා 2018.09.12 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී වැඩමුළුවක් පවත්වන ලදී.





2.5 පාසල් නව නිපැයුම්කරුවන් සඳහා වන කුසලතා සංවර්ධන වැඩමුළුව

“සහසක් නිමැවුම්” ජාතික ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලැබූ පාසල් අංශයේ නව නිපැයුම්කරුවන් තුන්සිය පහළොවක පිරිසක් වෙනුවෙන් කුසලතා සංවර්ධන වැඩමුළුවක් (Presentation Skills Development Workshop) 2018 අගෝස්තු මස 01 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. “සහසක් නිමැවුම්” සඳහා ඉදිරිපත් වන සෑම නව නිපැයුම්කරුවෙකුටම ජයග්‍රහණයක් හිමි වීම අපේක්ෂා කළ නොහැකි වුව ද තරඟාවලියෙන් ඔබ්බට යමින් ඔවුන්ගේ අනාගතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම, මහ පෙන්වීම හා අවබෝධය මෙම වැඩසටහන තුලින් ලබාදීමට කටයුතු යොදන ලදී.





2.6 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වෙළෙඳ පොළ දක්වා ගෙන යාමට හා පර්යේෂණ සඳහා සහාය දක්වමින් ඒවා මුදල් බවට පරිවර්තනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් IAFM-SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා ඇත. මෙය කොමිසමේ පනත මගින් දක්වා ඇති මූල්‍යාධාර ලබාදීමේ ක්‍රමවේදය තවදුරටත් ස්ථාවර හා පුළුල් පරාසයකට විහිදුවමින් නව නිපැයුම් වාණිජකරණය දක්වා සහාය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක ය. මූල්‍යාධාර අයදුම් කිරීමේ සිට වෙළෙඳ පොළ ජය ගන්නා අවසන් ඉලක්කය සපුරාලීම දක්වා අධීක්ෂණ කටයුතු පියවර ගණනාවක් යටතේ සිදු කරනු ලබයි.

2018 වසර සඳහා මූල්‍යාධාර ලබාදීම වෙනුවෙන් පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවන ලද අතර, දිවයිනම ආවරණය වන පරිදි සියළුම විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන යනාදිය සඳහා විශේෂිතව දැනුවත් කිරීමට ද කටයුතු කරන ලදී. ඒ අනුව අයදුම්පත් විසි එකක සංඛ්‍යාවක් ලැබී තිබුණි. එම අයදුම්පත් සියල්ල තාක්ෂණ කමිටු සඳහා යොමුකෙරුණු අතර, සුදුසුකම් ලැබූ නව නිපැයුම්කරුවන් සිවු දෙනෙකු සඳහා රු, 9,127,600.00 ක මුදලක් ප්‍රදානය කරන ලදී.

2.7 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන "නව නිපැයුම් දිරිය"

නව නිපැයුම් සඳහා මූල්‍යාධාර ලබාදීම, නව නිපැයුම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම, පොළී රහිත ණය ලබාදීම, මූලාකෘති සකස් කිරීමට උපකාර කිරීම මෙන්ම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට සහාය වීම යනාදී වශයෙන් නව නිපැයුම් වාණිජකරණයට ඇවැසි සහාය ලබාදීමේ වැඩසටහන් මාලාවක් "නව නිපැයුම් දිරිය - INVENT Grant Scheme" නමින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 2018 වසර සඳහා රුපියල් මිලියනයක ණය ලබාදීමත්, තවත් නව නිපැයුම්කරුවන් හත් දෙනෙකු වෙනුවෙන් ආධාර මුදල් ලබාදීමත් සිදු කරන ලදී. මේ සඳහා අනුමත වී නිකුත් කළ මුළු මුදල් ප්‍රමාණය රු. 13,680,910.00 ක් වේ.

2.8 නව නිපැයුම්කරුවනට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres)

ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වාණිජකරණය සඳහා වූ මාර්ගය සකස් කිරීම වෙනුවෙන් එම නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට මෙම ජාතික නවෝත්පාදන බීජෞෂණ මධ්‍යස්ථාන පිහිටුවන ලදී. ඒ අනුව ජා-ඇල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි හා යාපනය විශ්වවිද්‍යාලයෙහි මේ වන විට මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර ඇත.

2018 වසර සඳහා තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන තෝරාගැනීම සඳහා විශ්වවිද්‍යාල 05 කින් ලැබුණු ව්‍යාපෘති යෝජනා පහක ඇගයීම් කටයුතු සම්පූර්ණ කර, එයින් රජරට හා රුහුණ යන විශ්වවිද්‍යාල වල තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා එම ව්‍යාපෘති යෝජනාවල මූලික අංග සඳහා එකඟත්වය පළ කර ඇත. එම යෝජනා වැඩිදියුණු කර, කොමිසම වෙත බාර දීමට උපදෙස් දී ඇත. මිලියන 35කට අධික මුදලක් මේ සඳහා වෙන් කර ඇත.

2.9 "Innova Minds 2018" යොවුන් නව නිපැයුම්කරුවන් සඳහා වන රූපවාහිනී වැඩසටහන

යොවුන් නව නිපැයුම්කරුවන් ගේ දක්ෂතාවයන් ඉස්මතු කරවමින් ඔවුන් දිරිගැන්වීම සඳහා ක්‍රියාවට නැංවෙන ආකර්ශනීය වැඩසටහනක් වශයෙන් "Innova Minds" හඳුන්වා දිය හැකි ය. 2018 වසරේ දී පවත්වන ලද "Innova Minds 2018" වැඩසටහනෙහි ප්‍රධාන පරමාර්ථය වූයේ යොවුන් නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වාණිජකරණය කරමින් ඔවුන් දේශීය ආර්ථිකය සඳහා ප්‍රයෝජනවත් අයුරින් දායක කර ගැනීමයි. "සහසක් නිමැවුම් 2017" පාසල් අංශයේ තාක්ෂණික ක්ෂේත්‍ර මට්ටමේ ජයග්‍රහණ හිමි කර ගත් නව නිපැයුම්කරුවන් හට මෙම තරඟයට සහභාගී වීමේ අවස්ථාව උදා වුණි. වැඩසටහන අදියර කිහිපයක් යටතේ සංවිධානය කරන ලදී. මූලික පියවර වශයෙන් මෙම නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා වැඩිදියුණු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මැදිහත් වීම මත පිහිටවූ තාක්ෂණික බිජෝෂණ මධ්‍යස්ථාන වෙත යොමු කරන ලදී. ඉන් අනතුරුව එම වැඩිදියුණු කිරීම් අධීක්ෂණය සඳහා ඇගයීම් වටයක් පවත්වන ලද අතර, එහිදී වැඩසටහනෙහි පරමාර්ථය සපුරන ලද නිපැයුම් සඳහා "Innova Minds 2018" රූපවාහිනී වැඩසටහනට සහභාගී වීමේ අවස්ථාව හිමි විය.

වැඩසටහන් දහයකින් සමන්විත වූ "Innova Minds 2018" හි එක් එක් වැඩසටහන සඳහා යොවුන් නව නිපැයුම්කරුවන් තිදෙනා බැගින් සහභාගී වූ අතර, තරඟාවලියේ විනිශ්චය කටයුතු මූලික වටයේ විනිශ්චය හා අවසන් තරඟ විනිශ්චය වශයෙන් ප්‍රවීණ විනිසුරුවන් දෙපිරිසකගේ දායකත්වයෙන් සිදු කෙරුණි. මූලික වටයේ තරඟ 2018 නොවැම්බර් මස 02, 03 සහ 04 දිනයන් හි නාවල, විවෘත විශ්වවිද්‍යාලයේ දී පැවැති අතර, අවසන් මහා තරඟය 2018 නොවැම්බර් මස 28 වන දින මාලබේ පිහිටි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතන පරිශ්‍රයේදී පැවැත්විණි. "Innova Minds 2018" ප්‍රථම ස්ථානය හිමි කර ගැනීමට කළුතර ඥානෝදය විද්‍යාලයේ සඳළු සෙනෙවිරත්න ශිෂ්‍යයා ගේ නව නිපැයුම වන "මෝටර්බයිසිකල් සඳහා ස්වයංක්‍රීය පැති ආධාරකය" නම් වූ නිපැයුම සමත් විය. හරංගල ද්විතියික පාසලේ නදීශ තෙන්නකෝන් ශිෂ්‍යයා විසින් නිපදවන ලද "ඉලෙක්ට්‍රොනික ප්‍රේරණ දහරය හා වර්ණාවලි යන්ත්‍රය" දෙවන ස්ථානය ද, කොළඹ මියුසියස් විද්‍යාලයේ තිවින්යා ප්‍රේමරත්න ශිෂ්‍යාව ගේ නව නිපැයුම වන "හයිබ්‍රිඩ් ගෑස්කුකරය" තෙවන ස්ථානය ද හිමි කරගන්නා ලදී.



"Innova Minds 2018" විශේෂ අවස්ථා

2.10 ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ ප්‍රවේශය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ගේ දක්ෂතා ජාත්‍යන්තරය වෙත ගෙන යෑම සඳහා සුවිශේෂී මහපෙන්වීමක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතින් ලබාදෙන අතර, එමගින් ඔවුනට ජාත්‍යන්තර තරඟ අත්දැකීම පමණක් නොව විවිධ තාක්ෂණයන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවනවා මෙන්ම විවිධ වූ නව නිපැයුම්කරුවන් සමඟ එක්ව කටයුතු කිරීම තුලින් දැනුම හුවමාරු කරගැනීමට ද අවස්ථාව සැලසේ.

❖ 46 වන ජිනීවා ජාත්‍යන්තර නව නිපැයුම් තරඟාවලිය

ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවැත්වෙන ප්‍රමුඛ තලයේ නව නිපැයුම් තරඟාවලියේ 2018 වසරේ පැවැති තරඟයේ දී රන් පදක්කම් තුනක් (03)ක්, රිදී පදක්කම් තුනක් (03) හා ලෝකඩ පදක්කම් දෙකක් (02) දිනාගැනීමට ශ්‍රී ලංකාව නියෝජනය කළ නව නිපැයුම්කරුවන්ට හැකි විය.

නව නිපැයුම	නව නිපැයුම්කරු	ලැබූ ජයග්‍රහණය
ආශ්වාස ප්‍රශ්වාස වායු ප්‍රවාහ හඳුනාගැනීම සහ ප්‍රවාහ අනුපාතය මැනීමේ පද්ධතිය	ආචාර්ය මහේෂ් එදිරිසිංහ තිමිර තිලකරත්න	රන් සම්මානය
නිහාරීකරණ උපාංගය	වෛද්‍ය බී. වී. කේ. එම්. බෝපෙත්ත	රන් සම්මානය
අධි කාර්යක්ෂම හැඩලය	නාලක වන්ද්‍රවංශ	රන් සම්මානය
ස්වයංක්‍රීය බහුකාර්ය අල්ට්‍රාලයිට් ඩ්‍රෝනය	මහාචාර්ය රොහාන් මුණසිංහ ඇතුළු කණ්ඩායම	රිදී පදක්කම
දෘශ්‍යාභාධිත පුද්ගලයන් සඳහා වන තොරතුරු ස්පර්ශ පද්ධතිය	ප්‍රින්ස් වන්ද්‍රසේන	රිදී පදක්කම
පොල් කෙඳි ලබාගැනීම සඳහා වන ස්වයංක්‍රීය සිලින්ඩර සහ අඟුල් සහිත යන්ත්‍රය	රෙක්සි කුමාර් ප්‍රනාන්දු	රිදී පදක්කම
ශාක සාර මුඛ සේදුම් දියරය	වෛද්‍ය එන්. ආර්. බී. නිශ්ශංක	ලෝකඩ පදක්කම
අකුණු භූගත කිරීමේ පද්ධතිය	ඩී. එච්. එම්. හෙට්ටිආරච්චි	ලෝකඩ පදක්කම

❖ කොරියානු ජාත්‍යන්තර යොවුන් ඔලිම්පියාඩ් තරඟය - Korea International Youth Olympiad (KIYO 2018)

"සහසක් නිමැවුම් 2017" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේදී තාක්ෂණික ක්ෂේත්‍ර යටතේ දෙවන ස්ථාන හිමි කර ගත් යොවුන් නව නිපැයුම්කරුවන් සඳහා 2018 අගෝස්තු මස 10 සිට 12 දක්වා දකුණු කොරියාවේ පැවැති KIYO 2018 තරඟයට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමේ අවස්ථාව හිමි විය. එහිදී රන් පදක්කමක්, රිදී පදක්කම් දෙකක් සහ ලෝකඩ පදක්කමක් හිමි කර ගැනීමට සමත් විය.

❖ ජාත්‍යන්තර බුද්ධිමය දේපල, නව නිපැයුම්, නවෝත්පාදන හා තාක්ෂණ ප්‍රදර්ශනය
International Intellectual Property, Invention, Innovation and Technology Exposition (IPITEx 2018)

2018 පෙබරවාරි මස 02 සිට 06 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර පැවැති මෙම නව නිපැයුම් තරඟයේදී ශානික නිලෝක විසින් නිපදවන ලද "යතුරුපැදි සඳහා ප්‍රතිඅගුළු ත්වරණ පද්ධතිය" වෙනුවෙන් රන් සම්මානය හා ලෝක බුද්ධිමය දේපළ ආයතනයේ ගෞරව සම්මානය හිමි විය. චාමික සසේල හා සුපුන් චමල්ක විසින් නිපදවන ලද "ස්වර්ණාභරණ පෑස්සීම සඳහා භාවිතා කරන උපාංගය" වෙනුවෙන් රිදී පදක්කම සහ මැනිලා තරුණ නවෝත්පාදකයන්ගේ සංගමය වෙතින් රන් සම්මානයක් ද හිමි විය. මංජුල විජේසුන්දර හා ප්‍රවීන් අලහකෝන් යන යුගලය විසින් නිපදවන ලද "ස්වයංක්‍රීය සූර්යශක්ති දුරේක්ෂය" නම් නිපැයුම සඳහා පොලිටෙක්නිකා විශ්වවිද්‍යාලය මගින් පිරිනමන රන් සම්මානයක් හිමි විය. අයෝධ්‍යා වික්‍රමරත්න ගේ නව නිපැයුම වන "දර්ශක විලායකය" වෙනුවෙන් ලෝකඩ පදක්කමක් ද රුමේනියානු විශේෂ සම්මානයක් ද පිරිනැමුණි. විනෝජ් කුමාර් විසින් නිපදවන ලද "ගණිත ආධාරකය" නව නිපැයුම සඳහා ද ලෝකඩ පදක්කමක් හිමි වූ අතර, කාන්තා නව නිපැයුම් සංගමය විසින් පිරිනමන විශේෂ ත්‍යාගය ද හිමි විය.

❖ සිලිකන් නිම්න ජාත්‍යන්තර නව නිපැයුම් උළෙල
Silicon Valley International Invention Festival (SVIIF) 2018

ආචාර්ය මහේෂ් එදිරිසිංහ හා තිමිර තිලකරත්න විසින් නිපදවන ලද "ආශ්වාස ප්‍රශ්වාස වායු ප්‍රවාහ හඳුනාගැනීම සහ ප්‍රවාහ අනුපාතය මැනීමේ පද්ධතිය" නම් නව නිපැයුම ජූලි මස 02 සිට 04 දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා හි පැවැති SVIIF-2018 සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා රන් සම්මානයක් හිමි විය.

❖ ලෝක නව නිපැයුම් හා තාක්ෂණ ප්‍රදර්ශනය
World Invention and Technology Expo (WINTEX) 2018

2018 මාර්තු මස 12 සිට 14 දින දක්වා ඉන්දුනීසියාවේ පැවැති මෙම නව නිපැයුම් තරඟය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නව නිපැයුම්කරුවන් පස්දෙනෙකු සහභාගී වූ අතර, ඔවුන් සිය නිපැයුම් සඳහා රන් පදක්කම් හතරක් හා රිදී පදක්කමක් ද හොඳම වාණිජකරණ නව නිපැයුමට හිමි සම්මානය ද දිනාගැනීමට සමත් විය. ඩස්මන් මුණසිංහ මහතා ගේ නව නිපැයුම වන "දෙමුහුන් ඉලෙක්ට්‍රොනික ජ්වලන පරීක්ෂකය" සඳහා රන් පදක්කම සහ හොඳම වාණිජකරණ නව නිපැයුමට හිමි සම්මානය හිමි විය. ආසිරි දිල්හාන් ද සිල්වා මහතා විසින් නිපදවා ඇති "පළිබෝධ විකර්ශක මේස රැඳවුම", බෙනට් සිරිමාන්න මහතා නිපදවා ඇති "මුළුතැන්ගෙයි සේදුම් බේසම් අවහිරතා ඉවත්කිරීමේ උපාංගය" හා සනත් සූරියආරච්චි මහතා විසින් නිපදවන ලද "ස්වයංක්‍රිය වෝල්ටීයතා ආරක්ෂක පද්ධතිය" යන නව නිපැයුම් සඳහා රන් සම්මාන හිමි විය. "සමේ තෙතමනය සුරැකීම සඳහා ස්නානයේදී භාවිතා වන මෘදූකාරකය" නව නිපැයුම සඳහා රිදී සම්මානය පරිනැමුණු අතර එය ජානක කොටුවේගෙදර මහතා ගේ නිපැයුමකි.

❖ ලෝක නව නිපැයුම් නවෝත්පාදන තරඟය
World Invention Innovation Contest (WiC) 2018

2018 ජූනි මස 02 සහ 03 දිනයන් හි කොරියාවේ සෝල් නුවර පැවති ජාත්‍යන්තර නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කෙරුණු නව නිපැයුම් හයක් සඳහා රන් සම්මාන ද අට දෙනෙකු සඳහා රිදී සම්මාන ද හිමි විය.

නව නිපැයුම	නව නිපැයුම්කරු	ලැබූ ජයග්‍රහණය
ශ්වසන වායු ප්‍රවාහ හඳුනාගැනීම සහ ප්‍රවාහ අනුපාතය මැනීමේ පද්ධතිය	ආචාර්ය මහේෂ් එදිරිසිංහ තිමිර තිලකරත්න	රන් සම්මානය
පළිබෝධ විකර්ශක මේස රැඳවුම	ආසිරි දිල්හාන් ද සිල්වා	රන් සම්මානය
ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීමේ උපකරණය	ආසිරි දිල්හාන් ද සිල්වා දිනේෂ් සම්පත් දෙනිපිටිය	රන් සම්මානය
රෝගීන් සඳහා වන නිහාරිකරණය කිරීමේ උපාංගය	කමීර මධුසංක බෝපෙත්ත	රන් සම්මානය
මුළුතැන්ගෙයි සේදුම් බේසම් අවහිරතා ඉවත්කිරීමේ උපාංගය	බෙනට් සිරිමාන්න	රන් සම්මානය
දෑස් අඳ පුද්ගලයන් සඳහා තොරතුරු ස්පර්ශ පද්ධතිය	ප්‍රින්ස් චන්ද්‍රසේන	රන් සම්මානය
දෑස් අඳ පුද්ගලයන් සඳහා ද්‍රව මට්ටම් අධීක්ෂණ උපකරණය	ප්‍රින්ස් චන්ද්‍රසේන	රිදී සම්මාන
Coconut Printing Lansa	ක්‍රිෂාන්ත දේශප්‍රිය	රිදී සම්මාන
පොල් කෙඳි ලබා ගැනීම සඳහා ස්වයංක්‍රිය සිලින්ඩර සහ අඟුල් සහිත යන්ත්‍රය	රෙක්සි කුමාර්	රිදී සම්මාන
බලශක්ති සුරැකුම් පිසින බඳුන	ප්‍රසන්න විතානගේ	රිදී සම්මාන
දෙමුහුන් ඉලෙක්ට්‍රොනික් ජ්වලන පරීක්ෂක	ඩස්මන් මුණසිංහ	රිදී සම්මාන
ආරෝපණ උපකරණය	චතුර මධුමාල්	රිදී සම්මාන
පළතුරු නෙලීමේ උපකරණය	විජේකුමාර් විජිත්කුමාර් විජේකුමාර් කෙෂන්කුමාර්	රිදී සම්මාන
රෝල්ස් සෑදීමේ යන්ත්‍රය	තිමිත් නවෝද්‍ය	රිදී සම්මාන

2.11 ජාත්‍යන්තර සබඳතා

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත 2016 වසරේ දී ප්‍රදානය කරන ලද ජාත්‍යන්තර නව නිපැයුම් සංගමයේ (International Federation of Inventors' Association - IFIA) හා ලෝක නවෝත්පාදන හා බුද්ධිමය දේපළ සංගමයේ (World Invention Intellectual Property Association - WIIPA) සාමාජිකත්වය සමඟ දේශීය නව නිපැයුම්කරුවන් හට විදෙස් නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමේ වැඩිදුර අවස්ථාවන් හිමි වී ඇත.

2.12 නව නිපැයුම්කරුවන්ගේ හමුව

නව නිපැයුම්කරුවන් හට පැනනැගී ඇති ගැටළු හඳුනා ගනිමින් ඒ සඳහා ක්‍රමවත් විසඳුම් ලබාදීමත් අරමුණු කරගනිමින් සංවිධානය කරනු ලබන නව නිපැයුම්කරුවන්ගේ හමුව 2018 වසරේ දී නව නිපැයුම්කරුවන් එකසිය පනස් හතර (154) දෙනෙකුගේ සහභාගීත්වයෙන් මාර්තු මස 29 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන්නට යෙදුණි.





2.13 නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සේවා සැපයීම

රටේ ආර්ථික මෙන්ම සමාජයීය දියුණුව ද රඳා පවතින්නේ එම රටේ වෙසෙන ජනතාවගේ දැනුම, ආකල්ප හා කුසලතා මත පදනම්ව ය. ජනතාව සතු නිර්මාණාත්මක කුසලතාවයන් නිවැරදි මාර්ගයට යොමු කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එම නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීමේ අපේක්ෂාව සාර්ථකව ජය ගත හැක.

මෙම අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙන් සුවිශාල කාර්යභාරයක් උසුලන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, දිවයින පුරා නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට පියවර ගෙන තිබේ.

ඒ අනුව දිවයිනෙහි පළාත් නවය ම ආවරණය වන පරිදි, නව නිපැයුම්කරුවන් එක් දහස් අටක ගේ සහභාගීත්වයෙන් නවෝත්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම සෑම වැඩසටහනක් සඳහාම විවිධ සමාජ ස්ථරයන් නියෝජනය කරන, විවිධ වයස් කාණ්ඩයේ නව නිපැයුම්කරුවන් සහභාගී වීම විශේෂත්වයකි.








එමෙන්ම රටේ අනාගත මෙහෙයුම්කරුවන් වන පාසල් ප්‍රජාව වෙනුවෙන් නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, නොච්චියාගම විද්‍යාදර්ශ මහා විද්‍යාලය, කොළඹ නාලන්දා විද්‍යාලය, ගෝතමී බාලිකා විද්‍යාලය, ඩී. එස්. සේනානායක විද්‍යාලය, නාමිනිඔය ද්විතියික පාසල, මාවනැල්ල දරුල් උලූම් මධ්‍ය විද්‍යාලය හා මොරටුව ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය එවැනි විශේෂිත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද ස්ථානයන් වේ.








තව ද කොළඹ දේවි බාලිකා විද්‍යාලය, රත්නපුර කිරිඇල්ල මධ්‍ය මහා විද්‍යාලය, කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය හා ගම්පහ සිරිකුරුස යන පාසල් වල පැවැති නව නිපැයුම් තරඟ ඇගයීම සඳහා විනිශ්චය මණ්ඩලය යොදවමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සක්‍රීය දායකත්වය පාසල් දරුවන් වෙත ලබා දෙන ලදී.













එමෙන්ම කොළඹ පිහිටි සම්පත් බැංකු මූලස්ථානය, ගාල්ල ඩී.එස්.අයි. මූලස්ථානය හා කොළඹ ජාතික පර්යේෂණ සභාව යන ස්ථානයන් හි දී නව නිපැයුම් පිළිබඳ විශේෂ වැඩසටහන් පවත්වන ලදී.

කොළඹ රාජකීය විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "Spark 2018" නවෝත්පාදන ප්‍රදර්ශනයේ සමස්ථ ඇගයීම් කටයුතු සඳහා ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සමස්ථ දායකත්වය ලබාදුන් අතර, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් සංවිධානය කරන ලද "දීපව්‍යාප්ත නවෝත්පාදන ප්‍රදර්ශනය" සඳහා ද විනිශ්චය මණ්ඩලය යොදවමින් එහි ඇගයීම් කටයුතු සිදු කරන ලදී.





පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලද උපාධි අපේක්ෂකයන් සඳහා වන පර්යේෂණ සමුළුවෙහි නවෝත්පාදන ඇගයීම් කටයුතු සඳහා ද දායකත්වය දෙන ලද්දේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසිනි.





මට්ටක්කුලිය උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ආයතනයේ සිසුන් සඳහා නවෝත්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.





2.14 නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම යනු සීමිත ශ්‍රම බලකායක් තුලින් ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට හැකි සෑම අයුරකින්ම උපරිම සේවාවක් සැපයීමට කටයුතු කරන ආයතනයකි. කොමිසම සතුව වෙනම පර්යේෂණාගාරයක් නොමැති වුව ද දේශීය නව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීම වෙනුවෙන් විවිධාකාර වූ සහයෝගයන් නිර්මාණය කර දෙනු ලබයි. එහි එක් පියවරක් වන්නේ පෙර සඳහන් කර ඇති තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres) පිහිටුවීම යි.

ඊට අමතරව කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වැනි ආයතන වෙත ද නව නිපැයුම්කරුවන් ගේ පර්යේෂණ අවශ්‍යතාවයන් යොමු කරනු ලබයි. මෙලෙස පර්යේෂණයන් සඳහා වන පිරිවැය ද ප්‍රතිපූරණය කරනුයේ ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසිනි.

2.15 මානව සම්පත් සංවර්ධනය

දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් සුවිසල් මෙහෙවරක නිරත වන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සතු කාර්යමණ්ඩලය ශක්‍යතා පරිපූර්ණත්වයෙන් යුක්ත වීම රටේ සංවර්ධන ඉලක්කය හා සෘජු සම්බන්ධතාවයක් පවත්වයි. එබැවින් නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම වෙනුවෙන් කොමිසමේ කාර්යමණ්ඩලය විෂයගත විවිධ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී.

“කළමණාකරණ සහකාරවරයෙකු විසින් පවත්වා ගත යුතු ලේඛණ” පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා නිලධාරීන් දෙදෙනෙක් සහභාගී වූ අතර, “තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදන සහ ඇගයීමේ වැඩසටහන” සඳහා එක් නිලධරයෙක් සහභාගී කරවන ලදී. “ආයතනික විනය පරිපාටිය” පිළිබඳ වැඩමුළුව වෙනුවෙන් එක් නිලධරයෙක් ද “නිවැරදි ආකල්ප තුළින් අභිප්‍රේරණය” වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙක් ද “කාර්යාල උපකරණ පිළිබඳ පාලනය” සඳහා නිලධාරීන් දෙදෙනෙක් ද බැගින් සහභාගී විය. එමෙන්ම “කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම”, “ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා ගිණුම්කරණය”, “විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ වැඩමුළුව”, “ව්‍යවසාය ව්‍යාපෘති සහ ආයතනික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව”, “නිවාඩු ලිපිකරුවන් ගේ රාජකාරී හා වගකීම්”, “ප්‍රායෝගික ලංසු ඇගයීම” යන වැඩසටහන් සඳහා ද රාජකාරී ස්වරූපය මත පදනම්ව නිලධාරීන් දෙදෙනා බැගින් සහභාගී කරවන ලදී.

“ව්‍යවසාය ව්‍යාපෘති සහ ආයතනික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව” සඳහා නිලධාරීන් සිවු දෙනෙකු සහභාගී වූ අතර, “රියදුරන්ගේ රාජකාරී සහ වගකීම්” පිළිබඳ වැඩසටහන වෙනුවෙන් නිලධාරීන් තිදෙනෙක් සහභාගී කරවන ලදී.

2.16 මූල්‍ය ප්‍රාග්ධන ප්‍රගතිය





2.17 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සතු සුවිශේෂී බුද්ධිමය වත්කම්



නව නිපැයුම්කරුවන් සඳහා පිරිනැමෙන හැඳුනුම්පත



දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ අනුස්මරණ සමරු මුද්දරය

සහසක් නිමැවුම්
ஆயிரம் படைப்புகள்
Sahasak Nimavum
නවෝත්පාදනයේ
ශ්‍රී ලාංකේය
ප්‍රවේශය

ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟාවලිය

IFIA
INTERNATIONAL FEDERATION OF INVENTORS' ASSOCIATIONS

ජාත්‍යන්තර නව නිපැයුම් සංගමයේ සාමාජිකත්වය

WIIPA
WORLD INVENTION INTELLECTUAL PROPERTY ASSOCIATION

ලෝක නවෝත්පාදන හා බුද්ධිමය දේපළ සංගමයේ සාමාජිකත්වය

නව නිපැයුම් දිරිය
புத்தாக்கத்துக்கு கைகொடுத்தல்

නව නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා වැඩි දියුණු කිරීම වෙනුවෙන් සහාය දක්වන ව්‍යාපෘතිය

IAFM SL

